ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

# සංවර්ධන නිලධාරි සේවයේ II ශ්‍රේණියේ නිලධාරීන්ගේ

## කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2022

## ආයතන සංග්‍රහය හා කාර්ය පරිපාටික රීති

කාලය පැය 02 යි.

මුළු ලකුණු 100 යි.

ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.

---

01. I අවසර පත්‍රයක් හෝ දුම්රිය බලපත්‍රයක් නොමැතිව දුම්රියෙන් ගමන් කළ හැක්කේ කාටද?
    II දුම්රිය බලපත්‍රයක් නිකුත් කළ හැක්කේ කවර කටයුතු සඳහාද?
    III පාවිච්චි නොකරන ලද දුම්රිය බලපත්‍රයක් සම්බන්ධව ගත යුතු ක්‍රියාමාර්ග මොනවාද?

02. I රජයේ නිලධාරියකුට ලබා ගත හැකි නිවාඩු වර්ග 10 ක් සඳහන් කරන්න.
    II ඉකුත් නිවාඩු යනු මොනවාද?
    III ඉකුත් නිවාඩු ලබා ගත හැකි අවස්ථා පැහැදිලි කරන්න.

03. I රජයේ නිලධාරියකු විසින් සිදු කළ හැකි වරදවල් සම්බන්ධ පළමුවන උපලේඛනයේ ඇතුළත් වැරදි 10 ක් සඳහන් කරන්න.
    II "පළමු ලේඛනයේ" අන්තර්ගත වැරදි සඳහා වරදකරු වන නිලධාරියකුට එරෙහිව ලබාදිය හැකි දඬුවම් මොනවාද?

04. I අතිකාල දීමනා ලබා ගැනීමට හිමිකම් නොමැති නිලධාරීන් කවුරුන්ද?
    II අතිකාල දීමනා ගෙවීම සඳහා පැයක අගය තීරණය කරන්නේ කෙසේද?
    III රජයේ නිවාඩු දිනක සේවය කරන නිලධාරියකුට ලබාගත හැකි පහසුකම් මොනවාද?

05. I මූලික විමර්ශනයක් යනු කුමක්ද?

II "චෝදනා පත්‍රයක්" යන්න විග්‍රහ කරන්න.

III චෝදනා පත්‍රයක ඇතුළත් කරනු ලබන මූලික කරුණු 10 ක් සඳහන් කරන්න.

06. I සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනීමේ පටිපාටි යනු කුමක්ද?

II ඌව පළාත් රාජ්‍ය සේවයට පත්කරනු ලැබීමට නුසුදුසු තැනැත්තන් කවුරුන්ද?

07. I "රජයේ නිලධාරියා" යන්නෙන් අදහස් කරන්නේ කවුරුන්ද?

II "මාණ්ඩලික ශ්‍රේණියේ නිලධරයා" යන්නෙන් අදහස් කරන්නේ කවුරුන්ද?

III ඌව පළාත් රාජ්‍ය සේවකයකුගේ සාමාන්‍ය හැසිරීම තුල දක්නට ලැබිය යුතු මූලික ලක්ෂණ මොනවාද?

08. පහත සඳහන් කරුණු වලින් 4 ක් පිළිබඳව කාර්ය පටිපාටි රීති සංග්‍රහයේ විධිවිධානයන් විග්‍රහ කරන්න.

i. පරිවාස කාලය
ii. පත්වීම ස්ථිර කිරීම.
iii. පත්වීම අවසන් කිරීම.
iv. ඌව පළාත් රාජ්‍ය සේවයෙන් ඉල්ලා අස්වීම.
v. තනතුර අත්හැර යාම.
vi. ජ්‍යෙෂ්ඨත්වය